# (අම්බලන්තොට කොට්ඨාශයේ පාසල් වල) කණිෂ්ඨ ද්විතීයික ශ්‍රේණිවල දී සිසුන් ගිලිහීම ගැන ගුරුවරුන්ගේ සංජානනය පිළිබඳ අධ්‍යයනයක්

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනපති උපාධියට අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කෙරෙන නිබන්ධනයයි.

ජේ. බී. නාමලී රේණුකා
ශිෂ්‍ය අංකය : 59807731

අධ්‍යාපන පීඨය
විවෘත විශ්ව විද්‍යාලය
නාවල
නුගේගොඩ

OPEN UNIVERSITY
66974

66974

DEAN
FACULTY OF EDUCATION
The Open University of Sri Lanka
NAWALA, NUGEGODA.

## සංක්ෂේපය

ශ්‍රී ලංකාවේ වර්තමාන අධ්‍යාපන ක්‍රමය තුළ විවිධ ගැටළු රාශියක් දැකිය හැක. මෙම ගැටළු නිවැරදිව හඳුනා ගැනීමත්, එම ගැටළු සඳහා උචිත විසඳුම් සෙවීමත්, අධ්‍යාපන ක්‍රමයෙහි මෙන් ම සමාජ ක්‍රමයෙහි සංවර්ධනයට හේතු වේ. ඒ සඳහා බලයට පත්වන රජයන් හට විශාල වගකීමක් පැවරේ.

සිසුන් අකාලයේ විවිධ අවස්ථා වල දී ගිලිහී යාම වර්තමානයේ පාසල් පද්ධතියේ දක්නට ලැබෙන ගැටළුවකි. ඔවුහු වැඩ ලෝකයට පිවිසෙන්නේ නිසි පුහුණුවක් නොලැබීමෙනි. එය දේශපාලන, ආර්ථික, සාමාජික ගැටළු රාශියක් ඇති කිරීමට හේතු වේ. සිසුන් අකාලයේ ගිලිහීම නිසා අධ්‍යාපනය සඳහා කරනු ලබන පිරිවැය නාස්තියක් සිදුවේ.

අකාලයේ ගිලිහෙන්නන් කෙරෙහි අවධානය නොදැක්වීම නිසා ඔවුන් නොයෙකුත් අපචාර වලට යොමු වීමට ඉඩ තිබේ. ඔවුන් තුළ පවතින මානසික අසහනකාරී තත්ත්වය මත අනර්ථකාරී ක්‍රියා වලට සම්බන්ධ වීමට ඉඩ තිබේ.

අකාලයේ ගිලිහීමේ ගැටළුව පිළිබඳ සොයා බැලීම සඳහා අම්බලන්තොට කොට්ඨාශයේ 1 C පාසල් ඇසුරින් මෙම අධ්‍යයනය සිදු කරන ලදී. ගුරු සංජානනය ඇසුරින් ලබා ගත් තොරතුරු අනුව අකාලයේ ගිලිහීම පිළිබඳ තොරතුරු අනාවරණය කර ගැනීමට හැකි විය.

සාහිත්‍ය විමර්ශනය ඇසුරින් ලබා ගත් තොරතුරු අනුව අකාලයේ ගිලිහීමට බලපාන හේතු රාශියක් අනාවරණය විය. මෙම පර්යේෂණයේ දී වැඩි අවධානයක් යොමු කර ඇත්තේ අවාසිදායක පරිසර වල ජීවත් වන දරුවන්ගේ ගිලිහීමට බලපාන සමාජ හා ආර්ථික හේතු පිළිබඳවය.

සැමට අධ්‍යාපන අවස්ථා ලබා දීමට රජය මෙහෙයවන සුභ සාධන කටයුතු රැසක් ඇතත්, ගිලිහුණු සිසුන් පාසලේ රඳවා ගැනීමට එම ක්‍රියා මාර්ග අපොහොසත් වී ඇති බව සනාථ වේ. එම නිසා අකාලයේ ගිලිහීමේ ගැටළුව පිළිබඳ වැඩි අවධානයක් යොමු කළ යුතු වේ.